www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය දකුනු පලාත්සභා මැතිවරනයට ඉදිරිපත් වේ

## Sri Lankan SEP stands in the Southern Provincial Council election

**සමාජවාදී සමානතා පක්ෂය විසිනි**

**2009 සැප්තැම්බර් 05**

ලබන ඔක්තෝබර් 10 දා පැවැත්වීමට නියමිත දකුනු පලාත් සභා මැතිවරනයේ දී ගාලු දිස්ත්‍රික්කයට අපේක්ෂකයන් 26 දෙනෙක් ඉදිරිපත් කර සිටින ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) එම අපේක්ෂකයන්ට ඡන්දය දෙන ලෙස වැඩ කරන ජනතාවගෙන් සහ තරුනයින්ගෙන් ඉල්ලා සිටී.

සමාජවාදී සමානතා පක්ෂයේ අපේක්ෂක ලැයිස්තුවට වතු කම්කරුවන්, කාර්මික කම්කරුවන්, ගුරුවරුන්, ශිෂ්‍යයන් සහ ගෘහනීන් ඇතුලත් ය. එම ලැයිස්තුවේ මූලිකත්වය දරන්නේ සමාජවාදී සමානතා පක්ෂයේ පෙරගමන්කරු විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ ආරම්භක සාමාජිකයෙක් ද සමාජවාදී සමානතා පක්ෂයේ දේශපාලන කොමිටි සාමාජිකයෙක් ද වන රත්නසිරි මලලගම ය. ඔහු සිය වැඩිහිටි ජීවිතය ම කම්කරු පන්තියෙහි පන්ති උවමනාකම් ආරක්ෂා කිරීම සඳහා කැපකල කෙනෙකි.

සමාජවාදී සමානතා පක්ෂය පාලක පන්තියේ ද එම පන්තියේ දේශපාලන පක්ෂයන්ගේ ද ගඳගහන ජාතිකවාදය සහ වර්ගවාදයට එරෙහිව සිංහල, දෙමල සහ මුස්ලිම් කම්කරුවන් එක්සත් කිරීම සඳහා සටන් කරයි.

කම්කරු පන්තියට තමන්ගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සහ ජීවන තත්ත්වයන් ආරක්ෂා කර ගත හැක්කේ එකම ආකාරයකිනි. එය වනාහී සමාජවාදය සඳහා පෘථුල ජාත්‍යන්තර අරගලයෙහි කොටසක් ලෙස කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ ආන්ඩුවක් පිහිටුවීමට සටන් වදින ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැගීම බව අපි අවධාරනය කර සිටිමු.

කොලඹ පැවතෙන හා පැවතුනු සියලු ආන්ඩු විසින් කරගෙන යනු ලැබූ දෙමල විරෝධී යුද්ධයට විරුද්ධව ස්ථිරසාරව නැගී සිටිමින් උතුරු සහ නැගෙනහිර පලාත්වලින් ශ්‍රී ලංකාවේ හමුදාව කොන්දේසි විරහිතව ඉවත් කර ගත යුතු යයි කියා සිටි එකම පක්ෂය නම් සමාජවාදී සමානතා පක්ෂය යි. ශ්‍රී ලංකාවේ හමුදාව විසින් දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය පරාජය කිරීම වැඩ කරන ජනතාවට සාමය හෝ සමෘද්ධිය කිසිසේත් ම ගෙන එනු නැතැයි අපි අනතුරු අඟවා සිටිමු. ඒ වෙනුවට සිදුවනවා ඇත්තේ වැඩ කරන ජනතාවගේ ජීවන තත්ත්වයන් හා ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට වඩ වඩාත් උග්‍ර ප්‍රහාර එල්ල කිරීම ය.

උතුරු නැගෙනහිර පලාත්වල දෙමල ජනතාවට සිදු කරන ලද විනාශය වනාහී පාලක පන්තිය මුලු රටේම සමස්ත වැඩ කරන ජනතාවට එරෙහිව සිදු කරන්නට සූදානම් වන විනාශය පිලිබඳ ගොරතර ඇඟවුමකි. තුන්ලක්ෂයකට ආසන්න දෙමල සිවිල් ජනතාව ජරාගොහොරු වන් රැඳවුම් කඳවුරු තුල දැන් සිරකර තබා ඇත; මෙය වනාහී ඔවුන්ගේ මූලික ව්‍යවස්ථාමය හා නීතිමය අයිතිවාසිකම් තුච්ඡ ලෙස උල්ලංඝනය කිරීමකි. ආන්ඩුව නිදහස් කර ගත්තායයි කියන ප්‍රදේශ දිගින්දිගටම අල්ලාගෙන සිටීම සඳහා අලුත් හමුදා කඳවුරු දැනට ම පිහිටුවාගෙන යනු ලැබේ.

යුද්ධයේ අවසානයක් ගැන කතාකරන ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ජල්ලි ගෝසාවට කම්කරුවන් සහ තරුනයන් රැවටිය යුතු නැත. මෙම මැතිවරනය වනාහී ආන්ඩුව විසින් තමන්ගේ ප්‍රතිගාමී පිලිවෙත්වලට ඊනියා වරමක් ලබා ගැනීම සඳහා පවත්වන පලාත්සභා ඡන්ද විමසීම් මාලාවේ අලුත්ම එක ය. මීට කලින් පවත්වන ලද පලාත්සභා මැතිවරනවල දී ජනාධිපති රාජපක්ෂගේ ආන්ඩුවට ජයක් ලබා ගත හැකි වූයේ නිල විරුද්ධ පක්ෂයන් වන - එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) - ඔහුගේ යුද්ධයට ආධාර කල නිසා ද දැනටත් ඔහුගේ පොලිස් රාජ්‍ය වැඩපිලිවෙලට සහයෝගය දෙන නිසා ද ඔහුගේ ආර්ථික පිලිවෙත් සමග ඔවුන්ට මොනම ප්‍රතිපත්තියානුකූල වෙනසක් නැති නිසා ද වේ.

රාජපක්ෂ ආන්ඩුව දැනටමත් "ජාතිය ගොඩනැගීම" සඳහා යයි නව "ආර්ථික යුද්ධයක්" ප්‍රකාශයට පත් කර ඇත. ඔහුගේ මේ වචනවලට ඇත්තේ එකම එක අර්ථයකි; එනම් ගැඹුරු වන්නා වූ ආර්ථික අර්බුදයේ බර වැඩ කරන ජනතාවගේ කර පිට පැටවීම ය.

සොල්දාදුවන් යුද්ධයේ දී කැප කල පරිද්දෙන් ම කම්කරුවන් ද "ජාතිය වෙනුවෙන් කැපකල යුතු යයි" රාජපක්ෂ ප්‍රකාශ කර තිබේ. මෙහි තේරුම නම් සිවිල් යුද්ධය සඳහා අවුරුදු 30ක් තිස්සේ භයංකර වන්දියක් ගෙවූ වැඩ කරන ජනයා දැන් ධනේශ්වර අතලොස්සකගේ ලාභ තර කර ලීම සඳහා තවතවත් දුක් ගනිමින් වඩ වඩාත් අඩු පඩියකට දිග පැය ගනන් වැඩ කල යුතුය යන්න ය.

රාජපක්ෂ තමාගේ යුද්ධයට මුදල් සොයාගැනීම සඳහා රට අන්තයට ම නය කලේ ය. මේ අතර 1930 ගනන්වලින් පසු එලඹී ඇත්තාවූ දරුනුම ලෝක අර්බුදයෙන් ආර්ථිකය බැට කා ඇත. ඇමරිකානු ඩොලර් බිලියන 2.6ක නය මුදලක් හිඟා කා පන ගැටගසාගැනීම සඳහා කොලපත අතින් ගෙන යාමට ආන්ඩුවට සිදු වී තිබේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් රාජපක්ෂ ආන්ඩුව මත පටවා ඇති කොන්දේසිවලින් එකක් නම් මේ අවුරුද්දේ දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට 9ක් තරම් ඉහල යනු ඇතැයි ගනන් බලා තිබුනු අයවැය හිඟය 2011 වන විට සියයට 5 දක්වා පහත දමාගැනිය යුතුය යන්න ය. ආන්ඩුව දැනට මත් මෙම අරමුනු උදෙසා රාජ්‍ය අංශයේ සියලු සේවකයන්ගේ වැටුප් වැඩිවීම ඇනහිටවා තිබේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නියම කර ඇති ඉලක්කයන් ඉටු කිරීමේ දී පොදු අධ්‍යාපන සෞඛ්‍ය සහ සමාජ සුබසාධනය යනාදී සෑම අංශයකම වියදම් දරුනු ලෙස කපා දැමීමට ආන්ඩුවට සිදු වනු ඇත.

මෙහි අනික් පැත්ත නම් බංකොලොත් ගැසූ කර්මාන්ත හිමියන් ගොඩදාගැනීම සඳහා ආන්ඩුව රුපියල් බිලියන ගනන් යට කිරීම ය. ආන්ඩුව විවිධ ආයෝජකයන් ආකර්ෂනය කර ගැනීම සඳහා අලුත් නිදහස් වෙලඳ කලාප විවෘත කරමින් සිටී. ජනාධිපති රාජපක්ෂ මෑත දී ෆෝර්බ්ස් මැගසින් නමැති මහා ධනපතියන්ගේ සඟරාවට කියා සිටියේ විදේශීය ආයෝජකයින්ට ආකර්ෂනීය ලාභ ශ්‍රම සූරාකෑම් කඳවුරු ලංකාවේ තහවුරු කර දීම සඳහා සිංගප්පූරු වර්ගයේ "වන් ස්ටොප් ෂොප්" (එක්වර සියලු වැඩ නිම කර ගත හැකි තිප්පලක්) සාදා දෙන බවය.

කම්කරු පන්තිය සමග මුහුනට මුහුනලා කෙරෙන සට්ටනයක් අත ලඟ බව රාජපක්ෂ මැනවින් දනී. ඉහලයන උද්ධමනය, රැකියා විනාශය සහ සමාජ සුබසාධන සේවා වියැකී යාම වැඩ කරන ජනතාවගේ ජීවිතවලට දැරිය නො හැකි තත්ත්වයක් උද්ගත කර තිබේ. වතුවල ද සෞඛ්‍යසේවයේ ද වරායේ ද තෙල් හා බලශක්ති අංශයන්ගේ ද කම්කරුවෝ වැඩි පඩි ඉල්ලා සිටිති. ශිෂ්‍යයෝ ද රක්ෂා නැති උපාධිධාරීහු අධ්‍යාපන තත්ත්වයන් දියුනු කරන ලෙස ද රැකියා ලබා දෙන ලෙස ද උද්ඝෝෂනය කරමින් සිටිති.

මෙම ඉල්ලීම් ලබා දීමට නොහැකි ආන්ඩුව දැන් සූදානම් වන්නේ යුද්ධයේ දී හදාවඩාගත් පොලිස් රාජ්‍ය යන්ත්‍රය වැඩ කරන ජනතාවගේ අරගලයන් මර්දනය කිරීම සඳහා යොදාගැනීමට ය. යුද්ධය අවසන් වී ඇති නමුත් රාජපක්ෂ හදිසි නීති පාලනය ද අති දරුනු ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත ද දිගින්දිගටම පවත්වාගෙන යයි; එය එසේ කර ගෙන යාමට රාජපක්ෂට හැකි වී තිබෙන්නේ විරුද්ධ පක්ෂවල සහයෝගය නිසා ම ය. හමුදාව විසුරුවා හරිනවා වෙනුවට ආන්ඩුව සැලසුම් කරන්නේ තවත් භටයින් 50,000ක් බඳවා ගැනීමට ය. මේ උතුරේ හා නැගෙනහිරේ කඳවුරුවල රඳවා තැබීමට පමනක් නොවේ. සෙසු පලාත්වල මහජනතාවට විරුද්ධව යෙදවීම සඳහා ද දිවයින පුරාම පැන නගින සමාජ නැගිටීම මර්දනය කිරීම සඳහා ද වේ.

ගතවූ අවුරුදු හතර තිස්සේ රාජපක්ෂ රට පාලනය කර ඇත්තේ සිය බෑයන් ද ඉහල හමුදා නිලධාරීන් ද ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් ද ඇතුලත් දේශපාලන යුදමය කල්ලියක් මගිනි. රාජපක්ෂ ව්‍යවස්ථාව නොතකා හැර ඇත. ශ්‍රේෂ්ඨාධිකරන තීන්දු නොතකා හැර ඇත. කැබිනට් මන්ඩලය සහ පාර්ලිමේන්තුව හුදු රබර් සීල් බවට පත් කර ඇත. ආරක්ෂක හමුදාවල අනුදැනුම යුතුව ක්‍රියා කරන රහසිගත මිනීමරු කල්ලි නිදැල්ලේ පුවත්පත් කලාවේදීන් ද ආන්ඩුවේ විරුද්ධවාදීන් ද බලෙන් පැහැරගෙන යමින් තලමින් සහ මිනීමරමින් සිටිති.

කම්කරු පන්තියට විරුද්ධව මෙම සියලුම ක්‍රම-සහ-විධි පාවිච්චි කෙරෙනු ඇතැයි සමාජවාදී සමානතා පක්ෂය අනතුරු අඟවා සිටී. යුද්ධය පැවතුනු දවස්වල රාජපක්ෂ යලි යලිත් වැඩ වර්ජක කම්කරුවන් හෙලා දුටුවේ "ජාතික ආරක්ෂාව ට" වින කරන්නන් ලෙස ය. දැන් තමාගේ "ජාතිය ගොඩනැගීමේ" වැඩ පිලිවෙලට තර්ජනයක් එල්ල කරන කවුරුන්ට වුවත් එරෙහිව රාජපක්ෂ එම භාෂාව ම පාවිච්චි කරනු ඇත. පසුගිය මාසයේ දී පිලිකා රෝහලේ හෙදියන්ගේ වර්ජනයක් බිඳීම සඳහා ආන්ඩුව නාවුක හමුදා හෙදියන් යොදාගති. දැන් විදුලිබල කම්කරුවන් වැඩ වර්ජනය කලහොත් ඔවුන්ට විරුද්ධව හමුදාව සහ පොලීසිය යොදවන බවට ආන්ඩුව තර්ජනය කර සිටී.

විරුද්ධ පක්ෂයන් එකක් වත් කම්කරුවන්ගේ සහ පීඩිත ජනයාගේ අවශ්‍යතා නියෝජනය කරන්නේ නැත.

1983 දී යුද්ධය දියත් කලේ දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) යි. පසුව දශකයකට වැඩි කාලයක් යුද්ධය පවත්වාගෙන ගියේ ද එක්සත් ජාතික පක්ෂයයි. ජනාධිපති රාජපක්ෂ යුද්ධය අලුතෙන් පටන් ගත් කල්හි එක්සත් ජාතික පක්ෂය ඊට ද සම්පූර්න සහයෝගය දුන්නේ ය. ආන්ඩුවේ සාගත පියවරයන්ට විරුද්ධවනවා වෙනුවට එක්සත් ජාතික පක්ෂය ප්‍රසිද්ධියේ ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් නය ගැනීමට ද එහි කොන්දේසි ක්‍රියාත්මක කිරීමට ද සහාය දුන්නේ ය. 1983-94 කාල පරිච්ඡේදයේ දී එක්සත් ජාතික

පක්ෂය පවත්වාගෙන ගිය පාලනය පෙන්නුම් කරන්නේ දැන් ඔවුන් ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳව කරන ඉච්චා බස් කිසිසේත් ම විශ්වාස කල නොහැකි බවයි.

ජනතා විමුක්ති පෙරමුන 2005 ජනාධිපති මැතිවරනයේ දී රාජපක්ෂ ට ආධාර කලේ ය. ඉක්බිති ඔහු යලි ඇරඹූ යුද්ධයට මුලුමනින් ම සහාය දෙමින් විපක්ෂයේ ආසන වල වාඩි වී සිටින ගමන් ම ඔහුගේ ආන්ඩුවේ අයවැයට පක්ෂව ඡන්දය දුනි. වැඩකරන ජනතාවගේ ආරක්ෂකයා ලෙස බොරු රඟපෑමක් කරන ජවිපෙ ඒ අතරම, වෘත්තීය සමිති සහ වෙනත් පෙරමුනු, සංවිධාන කරන්නේ කම්කරුවන්ගේ අරගල ආන්ඩුවට තර්ජනයක් වන විට ඒවා කඩාකප්පල් කිරීමට ය. ආන්ඩුවට ඇතුල්වී එයට සහයෝගය දීමට දැනුදු සූදානම් වී සිටින ජවිපෙ ඊට පාලම ලෙස "ජාතිය ගොඩනැගීමේ" යෝජනා මාලාවක් රාජපක්ෂට ඉදිරිපත් කර සිටියේ මීට මාස කීපයකට පෙර ය.

දකුනු පලාත් සභාව සඳහා තරග වැදී සිටින තවත් හිටපු රැඩිකල් කන්ඩායම් දෙකකි. එනම්, එක්සත් සමාජවාදී පක්ෂය (එසප) සහ නව සමාසමාජ පක්ෂය (නසසප) යි. මේ පක්ෂ දෙකට ම ඇත්තේ එකිනෙකා සමග ම ද ප්‍රමුඛ ධනපති පක්ෂ සමග ද අවස්ථාවාදී සන්ධානයන් ඇති කර ගැනීම පිලිබඳ දිගු වාර්තාවකි. ධනපති පන්තියේ සියලුම කන්ඩායම්වලට එරෙහිව කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනතාවය අත් පත් කර ගැනීමේ අරගලය කෙරේ ඔවුන් දක්වන්නා වූ ඓන්ද්‍රීය විරෝධය වනාහී ඔවුන්ගේ දේශපාලනයේ නිල ලාංඡනය යි.

එක්සත් සමාජවාදී පක්ෂය සහ නව සමසමාජ පක්ෂය යන පක්ෂ දෙකම අවුරුදු ගනනාවක් තිස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග පෙල ගැසී සිටියහ. ඔවුහු එම පාවාදීම යුක්තිසහගත කර ගැනීම සඳහා දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය හා සම කරන කල්හි රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය "අඩු නපුරක්" යයි තර්ක කිරීම ය. දැන් මේ පක්ෂ දෙකම එලෙසින්ම එක්සත් ජාතික පක්ෂය පස්සෙන් යති. එක්සත් සමාජවාදී පක්ෂය දැන් එක්සත් ජාතික පක්ෂයේ නිදහසේ වේදිකාවේ කොටස්කරුවෙකු වී එක්සත් ජාතික පක්ෂය ප්‍රජාතන්ත්‍ර අයිතීන් රකින්නේ යයි කියාපායි. නව සමසමාජ පක්ෂය ලඟදී එම හවුලෙන් ඉවත් වූ නමුත් රාජපක්ෂ ආන්ඩුවට විකල්පය සැපයෙන්නේ එජාපයෙන් යයි කියා සිටී.

නව සමසමාජ පක්ෂය සහ එක්සත් සමාජවාදී පක්ෂය යන මේ පක්ෂ දෙකම යුද්ධයේ විරුද්ධවාදීන් ලෙස බොරු රඟපෑමක් කලහ. ඇත්ත වශයෙන් නම් ඔවුන් දෙගොල්ලම කලේ අධිරාජ්‍යවාදීන් විසින් අටවන ලද සාම ක්‍රියාවලියට ද 2002 දී එල්ටීටීඊය සමග සාම සාකච්ඡා ආරම්භ කිරීමට එක්සත් ජාතික පක්ෂයේ ආන්ඩුව අත්සන් කල සටන්විරාම ගිවිසුමට ද ආධාර කිරීම ය. ඔවුහු යුද්ධය අවසන් කර සිංහල සහ දෙමල ධනපතියන් අතර බලය බෙදා ගෙන කම්කරු පන්තිය සූරාකෑම උග්‍ර කිරීමට, සිංහල හා දෙමල ධනපති දෙගොල්ල එකතුව ගෙනගිය, එක්සත් ජාතික පක්ෂය මූලිකත්වය ගත් සැලැස්මකට සහාය දුන්හ.

සමාජවාදී සමානතා පක්ෂය සහ එහි අපේක්ෂකයෝ මෙම සියලුම පක්ෂවලට විරුද්ධව, ජාත්‍යන්තර සමාජවාදී මූලධර්ම මත පදනම් වූ වැඩ පිලිවෙලක් ඉදිරිපත් කර සිටිති. 1948 ඊනියා නිදහසේ පටන් කම්කරු පන්තිය භේද කර දැමීම සඳහා ධනේශ්වර පාලක පන්තිය ද එහි දේශපාලන අන්තේවාසිකයන් ද පාවිච්චිකල ජාතිකවාදී සහ වර්ගවාදී වසවිස දුරීභූත කරදැමිය යුතුය. දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීම සඳහා ද කඳවුරුවල සිරකර සිටින සියලුම දෙනා නිදහස් කර හැරීම සඳහා ද උතුරු හා නැගෙනහිර පලාත්වලින් ආරක්ෂක හමුදා ඉවත් කිරීම සඳහා ද හදිසි නීතිය, ත්‍රස්ත විරෝධී පනත සහ වෙනත් ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරයන් ඉවත් කිරීම සඳහා ද සටන් වදින ලෙස අපි කම්කරුවන්ට කියා සිටිමු.

දෙමල කම්කරුවන් හා තරුනයන් එල්ටීටීඊයේ බිඳ වැටීමෙන් උගත යුතු වූ පාඩම් ග්‍රහනය කර ගත යුතු ය. එල්ටීටීඊයේ පරාජය වනාහී හුදෙක් යුදමය පරාජයක් වූයේ නැත. එය දේශපාලනමය බිඳවැටීමක් ද විය. එල්ටීටීඊයේ දෙමල බෙදුම්වාදී වැඩ පිලිවෙල නියෝජනය කලේ දෙමල ධනපති පන්තියේ අවශ්‍යතාවයයි. දෙමල මහ ජනතාවගේ අවශ්‍යතාවය නොවේ. එල්ටීටීඊ සංවිධානය "දෙමල ජාතිය" ආරක්ෂා කිරීමේ නාමයෙන් සිංහල සිවිල්වැසියන්ට ත්‍රස්තවාදී ප්‍රහාර එල්ල කරමින් ද සිය දේශපාලන විරුද්ධවාදීන් නිර්දය ලෙස මර්දනය කරමින් ද ජන කොටස් අතර භේදය ගැඹුරු කලේ ය. ධනපති ඊලම් රාජ්‍යයක් සඳහා එල්ටීටීඊය ඉදිරිපත් කල ඉල්ලීම සෑම විටම ප්‍රධාන බලවත් රාජ්‍යවලින් එකක හෝ කීපයක සහාය දිනාගැනීම මත රැඳී පැවතුන හෙයින් විනාශදායක උගුලක් බවට පත් විය. දෙමල කම්කරුවන් හා තරුනයන්ට තමන්ගේ ජීවන තත්ත්වයන් හා මූලික අයිතිවාසිකම් රැකගත හැක්කේ දිවයින පුරාම වැඩ කරන ජනතාවගේ පොදු අරගලයක් මගිනි.

ශ්‍රී ලංකාවේ ධනේශ්වරයේ සියලුම කල්ලි කන්ඩායම්වලට එරෙහිව කම්කරු පන්තියේ ස්වාධීනත්වය තහවුරු කර ගැනීමට සමාජවාදී සමානතා පක්ෂය සටන් වදී. කම්කරු පන්තියේ මිත්‍රයන් සොයාගත හැක්කේ ගතවූ අවුරුදු 60ක් තිස්සේ යුද්ධය දිලිඳුකම හා කාලකන්නිකම ගෙන ආ දූෂිත, තුච්ඡ දේශපාලන පක්ෂයන් අතර නොවේ; 1930 ගනන්වලින් මෙපිට ඇති වූ ලෝකයේ දරුනුතම අවපාතයේ බරබද්දල් පැටවී සිටින දකුනු ආසියාවේ සහ ජාත්‍යන්තරයේ කම්කරුවන් අතර ය.

ධනේශ්වර ක්‍රමයේ ලෝක අර්බුදයට ලෝකය පුරාම පාලක පන්තිය දී ඇති උත්තරය නම් ලෝක කරලිය තුල තම ආර්ථික සහ මූලෝපායික ආධිපත්‍යය තහවුරු කර ගැනීම සඳහා පිලිමල් ධනපති පාලකයන් සමග යුද වදින අතර ආර්ථික අර්බුදයේ මුලු බර කම්කරු පන්තිය මත පැටවීම ය. අද ලෝකය පුරාම මිලියන 50 කට අධික ජනයා රැකියා අහිමිව සිටිති. ඇමරිකා එක්සත් ජනපදය තුල පමනක් රැකියා අහිමිවූවන්ගේ සංඛ්‍යාව මිලියන 10 ඉක්මවා තිබේ. එක්සත් ජනපදයේ පාලක මහ ධනපති පන්තිය තම ආර්ථික පරිහානියෙන් ගැලවීගැනීම සඳහා මැදපෙරදිග ද මධ්‍යම ආසියාවේ ද ඉන්ධන සම්පත් බහුල ප්‍රදේශ මත තම ආධිපත්‍යය තහවුරු කර ගැනීමට වලිකමින් සිටී. ඉරාකයේ, ඇෆ්ඝනිස්ස්ථානයේ සහ දැන් පකිස්ථානයේ අධිරාජ්‍යවාදී මිලිටරි ආක්‍රමනවල අරමුන එයයි. ලෝකය මහ බලවතුන් අතර සට්ටන වල කරලිය බවට පත්ව ඇත; ලෝකයේ සෑම අස්සක් මුල්ලක් නෑර ම යුද්ධයේ තර්ජනය පැතිරෙමින් පවතී.

කම්කරු පන්තිය තමන්ගේ ම ජාත්‍යන්තර මූලෝපාය වර්ධනය කර ගත යුතුය. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ සිය සහෝදර පක්ෂයන්, එනම් ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය සමග එක්ව සමාජවාදී සමානතා පක්ෂ සටන් වැද සිටින්නේ බංකොලොත් ධනේශ්වර පද්ධතිය අහෝසි කර දැමීමට ද ඒවෙනුවට සැලසුම්ගත ලෝක ආර්ථිකයක් පිහිටුවා ලීමට ද වේ. ශ්‍රී ලංකාවේ දී ගම්බද පීඩිත ජනතාව මුහුන දී සිටින්නා වූ ව්‍යසනයෙන් එලියට මාර්ගයක් පෙන්නුම් කිරීමේ ලා සමත් පන්තිය වනාහී කම්කරු පන්තිය ම පමනි. සමාජවාදී සමානතා පක්ෂය සටන් වදින්නේ ධනපති අතලොස්සකගේ නොව අතිමහත් බහුතර පීඩිත ජනතාවගේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා සමාජවාදී පිලිවෙත් මත සමාජය ප්‍රතිනිර්මානය කිරීම උදෙසා කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ ආන්ඩුවක් පිහිටුවාලීමට ය. දකුනු ආසියාවේ සහ ජාත්‍යන්තරව සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකාවේ සහ ඊලම්හි සමාජවාදී සමූහාන්ඩුවක් පිහිටුවා ලිය යුතුව ඇතැයි අපි කියා සිටිමු.

සමාජවාදී සමානතා පක්ෂය පහත සඳහන් පිලිවෙත් ඉදිරිපත් කර සිටී:

## සෑම කෙනෙකුට ම සුරක්ෂිත හා මනා වැටුප් සහිත රැකියා

විරැකියා වසංගතය අවසන් කිරීමට ධනපතික්‍රමය අසමත් ය. පඩි අඩු නොකොට වැඩ සතිය පැය 30 ට කැපීම මගින් රැකියා ගනන වැඩිකල යුතු යයි සසපය යෝජනා කරයි. මනා වැටුප් සහිත රැකියා ලක්ෂ ගනන් නිර්මානය කිරීම සඳහා පොදු කාර්ය වැඩ පිලිවෙලක් මගින් නිවාස, පාසැල්, රෝහල් සහ මහාමාර්ග තැනීම සඳහා රුපියල් කෝටි සියගනනක් වෙන් කල යුතුය. මෙම වැඩපිලිවෙලේදී යුද්ධයෙන් විනාශ වූ උතුරු හා නැගෙනහිර පලාත් වලට මුල් තැන දිය යුතු ය.

## ගුනාත්මකව උසස් නිදහස් පොදු අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවා සඳහා

ආන්ඩුවේ සාගත වැඩපිලිවෙලේ ප්‍රථම ගොදුර වන්නේ අත්‍යවශ්‍ය සමාජ සේවාවන් ය. ආන්ඩුව දැනට ම ධනපති අතලොස්සක් සඳහා පුද්ගලික විශ්ව විද්‍යාල නිර්මානය කොට රාජ්‍ය සරසවි හා පොදු පාසැල්වල වියදම් කපා සේවක මන්ඩල කපා තදබදය වැඩි කොට පහසුකම් කාබාසිනියා කොට ඇත. අධ්‍යාපනය අවශ්‍ය සියලු දෙනාටම ලබාගත හැකිවන පරිදි නිදහස් වූ ද ඉහල ප්‍රමිතියකින් යුතු වූ ද අධ්‍යාපනය කරගෙන යාමට සරසවි දක්වා ද සරසවි තුල ද පොදු අධ්‍යාපනය මහ පරිමානව ප්‍රසාරනය කල යුතුව ඇතැයි සමාජවාදී සමානතා පක්ෂය කියා සිටී.

පොදු සෞඛ්‍ය සේවාව කෙරෙහි දක්වන්නාවූ පිලිකුල පිලිබඳව මනා උදාහරනයක් නම් මෑත දී ආන්ඩුව පිලිකා රෝහල් හෙදියන්ට අත්‍යාවශ්‍ය ආරක්ෂක උපකරන සම්පාදනය කිරීම ප්‍රතික්ෂේප කිරීමයි. පොදු සෞඛ්‍ය සේවා පද්ධතියේ බිඳවැටීම ඩෙංගු වැනි මාරාන්තික රෝග පැතිරීමට හේතු වී ඇත. පොදු රෝහල් වලට අත්‍යවශ්‍ය බෙහෙත් සහ උපකරන සැපයීම නතර කර ඇති අතර හැකි සියලුදෙනාම පුද්ගලික රෝහල්වලට තල්ලු කර යවනු ලැබේ. සෞඛ්‍ය සේවයෙන් ලාබ ගැරීම නතර කරන ලෙස ද ඉහල ප්‍රමිතියකින් යුතු සෞඛ්‍ය සේවා නොමිලයේ සෑම කෙනෙකුට ම ලබාදීම සඳහා මනා උපකරන සහ සේවා මන්ඩලවලින් යුතු පොදු රෝහල් හා සායන පිහිටුවා ලියයුතු යයි ද සසපය කියා සිටී.

## ගම්බද දිලිඳුකම මුලිනුපුටා දමනු

ධනේශ්වර පාලනයේ 60 අවුරුද්දක් ගම්බද පීඩිත ජනයා මුහුනපාන්නා වූ කිසිදු ප්‍රශ්නයක් විසඳ නැත. ලංකාවේ දිලින්දන්ගෙන් සියයට 88ක් ම ජීවත්වන්නේ ගම්බද පලාත්වල බව 2007 පිටවූ ලෝක බැංකු වාර්තාවක් පෙන්නුම් කරයි. ගොවියෝ ඉඩම් නැතිකමින් හා නය බරින් පරිපීඩිතව සිටිති. සහනාධාර කපාහැර ඇත. බඩු මිල ඉහල දමා එමගින් අතරමැදියන්ගේ සහ මහා ජාවාරම්කරුවන්ගේ ලාභ වැඩිකර ඇත. ගොවියෝ ද පාරිභෝගිකයෝ ද තව තවත් පහලට ඇද දමනු ලැබ සිටිති. ධීවරයෝ මීට අමතරව යුද්ධ ආරක්ෂාවට යයි අටවන ලද තහංචිවලට ගොදුරු වී සිටිති.

සියලු ඉඩම් නැති ගොවියන් ට රජය සතු ඉඩම් ජාති භේදයකින් තොරව බෙදා දිය යුතුව ඇතැයි සසපය කියා සිටී. බැංකු නය කෘෂිකාර්මික උපකරන පොහොර සහ රසායන ද්‍රව්‍ය පහසු මිලට සියලු දිලිඳු ගොවියන්ට ලබාදිය යුතුය. සෑම ගොවි පවුලකටම යහපත් ජීවන තත්ත්වයක් සාදාදීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදනයන් ට සහතික මිලක් ලබාදිය යුතුය. ධීවර

කර්මාන්තය මත පනවා ඇති සියලු ම යුදමය තහංචි ඉවත් කරනු.

ඉහත සඳහන් යෝජනා "යතාර්ථවාදී නැතැයි ද" "ප්‍රායෝගික නැතැයි ද" "ඒවා ක්‍රියාත්මක කිරීමට මුදල් ඇත්තේ නැතැයි ද" මහා ජාරම්කරුවන් හා ඔවුන්ගේ දේශපාලන ඒජන්තයන් නිරනුමානයෙන්ම කියනු ඇත. ඇත්ත වශයෙන්ම ඔවුන් මෙම පියවරයන්ට විරුද්ධ වන්නේ ඒවා ධනේශ්වර පුද්ගලික දේපල ක්‍රමයට කිසිසේත්ම ඔරොත්තු දෙන්නේ නැති නිසා ය. මහා කොම්පැනිකාර ජාවාරම්කරුවන්ගේ ලාබ උදෙසා නොව බහුතර දිළිඳු ජනයාගේ අවශ්‍යතාවය උදෙසා සමාජය උඩ සිට පහලට ප්‍රතිසංවිධානය කිරීම මගින් පමනි. මේවාට අවශ්‍ය මූල්‍යමය සම්පත් ඒකරාශී කර ගත හැකි වන්නේ. බැංකු සහ ප්‍රධාන පෙලේ වෙලඳ සමාගම් කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතට ගත යුතු ය.

සමාජවාදී සමානතා පක්ෂය දකුනු පලාත්සභාවේ ඡන්දයට මැදිහත් වන්නේ "ආන්ඩුවේ ආර්ථික යුද්ධයට" එරෙහි සමාජවාදී විකල්පයක් සඳහා පවත්නා ක්ෂනික කල්දැමිය නොහැකි අවශ්‍යතාවය පිලිබඳ පුලුල්ම සාකච්ඡාවක් වැඩ කරන ජනතාව තුල ඇරඹීමට ය. අපගේ පක්ෂ අරමුදලට ආධාර සපයමින් ද අපගේ ප්‍රසිද්ධ රැස්වීම්වලට සහභාගිවෙමින් ද අපගේ ලියකියවිලි බෙදාහරිමින් ද අපගේ අපේක්ෂකයන්ට ඡන්දය දෙමින් ද අප මැතිවරන ව්‍යායාමයට සහභාගිවන ලෙස සියලුම කම්කරුවන්ට, තරුන ජනයාට, ගෘහිනීන්ට, කුඩා ගොවියන්ට සහ රැකියා නැතියවුන්ට කියා සිටිමු. අප කම්කරුවන්ට සහ තරුනයන්ට කියා සිටිනුයේ සියල්ලටමත් වඩා අපගේ ඉදිරිදර්ශනය සහ ක්‍රියාමාර්ගය අධ්‍යයනය කරන ලෙස ද සමාජවාදී සමානතා පක්ෂය ට බැඳී එය ගොඩනගන ලෙස ද වේ.

දුරකතන අංකයඃ 011-2712104 මගින් හෝ ඊමේල් ලිපිනයඃ wswscmb@sltnet.lk මගින් සසප අමතන්න.

© www.wsws.org